




සිසිර දිසානායක

# අපේ කම හැර නොගිය සොඳුරු ගැමියා ඔබය

දිනය පහුගිය සැප්තැම්බර් විසි හතරවෙනිද,

සුපුරුදු පරිදි පරිගණකයේ අන්තර්ජාලයට පිවිසියේ විදුලි තැපෑල් ලියකියවිලි කියවීමටයි. අප ආදරණීය රෝහණ වීරසිංහ ප්‍රවීණයාණන්ගේ පුත් කලිඳු වීරසිංහ සොයුරාගෙන් ඇමිණීමකුත් සමඟින් ලියවිල්ලක් ..!

"ජෝ අබේවික්‍රම ප්‍රණාම ගීතය"

ගායනය : අමරසිරි පීරිස්
සංගීතය : රෝහණ වීරසිංහ
රචනය : බණ්ඩාර ඇහැළියගොඩ

අප අතරින් වියෝ වු රංගධරයාගේ අවසන් කටයුතු වලදී ප්‍රචාරය වුණ ගීය. කලාකරුවන් තිදෙනාගෙන් කවුරුන්ගෙන් ද ගීය පිළිබඳව විමසිය යුතු වන්නේ ?

මින් පෙරදී ද අපි අමරසිරි පීරිස් හා රෝහණ වීරසිංහ සංගීතවේදීන් "ගී සඳළුවේ" දී මුණගැසී ඇත්තෙමු. ගීයකට මුල පුරන්නේ ගේය පද නිබන්ධකවරයායි. එනයින් මේ ගීය වෙනුවෙන් බණ්ඩාර ඇහැළියගොඩ ප්‍රවීණ නිබන්ධකයාණන්ව ඇමතීමට අදහස් කළෙමු. මාස කීපයක් ගත වුවද සද නොමියෙන් කලාකරුවකු පිළිබඳව නිර්මාණය වු ගීයක් පිළිබඳව විමසීම් වැදගත්කම දැණුනු නිසාවෙනි. ඒ ප්‍රතිභාපුර්ණ, අසම සම රංගධරයෙකු පිළිබඳව ප්‍රවීණයෙකු අතින් ලියැවුණ පද පෙළකට හැඟුම් කැවු සිතුවිලි පිළිබඳව දැණුනු කුතුහලය නිසාවෙනි ඒ.

ඇත්තම කියනවා නම් අපිත් උපන් සබරගමු පළාතෙන්ම බිහිවුණ ජ්‍යෙෂ්ඨ, ඒ වගේම ශ්‍රේෂ්ඨ කලාකාරයෙක්නේ ජෝ අබේවික්‍රම මහත්තයා. ඒ වුණත් එහෙම පළාතකින් නගරයට ගියාය කියලා කිසිම දවසක වෙනස් නොවුණ නියම ගැමියෙක් වුණ නිසයි මගේ හිතේ ඒ මහත්තයා ගැන ළෙන්ගතුකමක් ඇතිවුණේ..." බණ්ඩාර ඇහැළියගොඩ ප්‍රවීණයා දුරකථනයෙන් අපහා එක්වෙමින් මුල පිරීය.

"කතා බහෙන්, හැසිරීමෙන්, ගමන " බිමනින් හැම වෙලාවෙම ගැමිකම ඉස්මතුවෙන විදිහේ නිර්ව්‍යාජ චරිතයක් ජෝ මහත්තයා. කොතැනක ගියත්, කොතැනක හිටියත් ජෝ මහත්තයා නියෝජනය කළේ ගම, ගැමිකම, සිංහලකම."

"ඒ හන්දම පොඩි කාලෙ ඉඳන්ම අපේ හිත්වලට කා වැදිලා තිබුණ ගමේ චරිත, ඒ වගේම පොත් පත්වල ලියැවිලා තිබුණ ගමේ චරිත ඉතා මැනවින් නිරූපණය කරන්න ජෝ මහත්තයාට පුළුවන් වුණා. ඒ වායේ කිසිම ආගන්තුක බවක් තිබුණෙ නෑ. දැන් බලන්න ගාමිණී ෆොන්සේකා මහත්තයා " හුළවාලි" චිත්‍රපටියේ රඟපාපු "ධාරා" ගේ චරිතය. මොනතරම් දක්ෂ විදියට ගාමිණී ෆොන්සේකා මහත්තයා රඟපෑවත් ජෝ අබේවික්‍රම මහත්තයා රඟපාපු "සිරිබෝ අයියා" චරිතය වගේ අපිට ළං වුණේ නෑ නේද ?"

"මොන සමාජ තලයක හිටියත් ගම නියෝජනය කරන මේ ගුණය හැමදම තිබුණ බව මගේ දීර්ඝ කාලීන ආශ්‍රය නිසා මට පෙණුන විශේෂත්වයයි."

"සිසිර මල්ලි දන්නවාද ජෝ මහත්තයාට ඉන්දියානු රාගධාරී සංගීතය ගැන හොඳ දැණුමක් තිබුණ බව ?" ඕනෑම ශාස්ත්‍රීය ගායනයක් අහලා මේ අහවල් රාගය කියලා කියන්න උන්නැහේට පුළුවන්කම තිබුණා."

"මීට අවුරුදු හත " අටකට උඩදී අපි ජෝ මහත්තයාට "චිරං ජයතු ජෝ !" කියලා උපහාර උත්සවයක් කළා. ඒ නමින්ම පොතකුත් එළි දැක්වුවා. රුපියල් ලක්ෂ දහයක මුදලකුයි වටිනා වාහනයකුයි පිරිනැමුවා. "පුර හඳ කරුවල" චිත්‍රපටියට ජාත්‍යන්තර සම්මාන ලැබුණ වෙලාවෙත් මම උපහාර ගීතයක් කළා. ඒ ගීතය ගායනා කළේ එඩ්වඩ් ජයකොඩි. ඒත් ඉතින් සබරගමුවෙන් ම බිහිවුණ ප්‍රවීණ ගායකයෙක් නේ. ඉතින් ඔය වැඩ වලදි ජෝ අයියා අපට තව තවත් ළං වුණා. ඒ හන්ද මේ වෙන් වීම සැහෙන්න හිතට දැනුණා.

"ජෝ අබේවික්‍රම මහත්තයා නැති වුණාට පස්සේ ඒ අවමංගල උත්සවය සංවිධානය කරපු කොමිටියට මාත් පත්කරගෙන තිබුණා. සංස්කෘත ඇමති, ජාතික රූපවාහිනී සංස්ථාවේ අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ අධ්‍යක්ෂක වගේම, මාලනී ෆොන්සේකා, රවින්ද්‍ර රන්දෙණිය, ජැක්සන් ඇන්තනි, රෝහණ වීරසිංහ වගේ කලාකරුවනුත් එතන හිටියා.

"මුලදී යෝජනා වුනේ ඉස්සර ගමේ විදියට කවි කොලයක් ලියලා ඒ විදියට අවමංගල උත්සවයේදී ගායනා කරන්න. පස්සෙ තීරණය කළා ගීතයක් නිර්මාණය කරමු ය කියලා. මට පැවරුණා ලියන්න. රෝහණ භාරගත්තා තනුවයි සංගීතයයි නිර්මාණය කරන්න. අමරසිරිට කතා කළා ගායනය කරන්න."

"ඇත්තටම මේ ගීතය හරිම කඩිනමින් ඉවර කරපු ගීතයක්. අද ගීතය ලිව්වා නම් හෙට සංගීතයයි තනුවයි යොදලා ගායනා කරලා දර්ශන පෙළකුත් එක්ක රූපවාහිනියේ විකාශය කළා."

බණ්ඩාර ඇහැළියගොඩ ප්‍රවීණයා "ගී සඳළුව" වෙනුවෙන් අප හා එක් වුයේ තවත් කර්තව්‍යයක යෙදී සිටිනා අතරතුරදීය. "උඹලා කතා කළාම කල් දන්නේ කොහොමද ? " සිය හෘදයාංගම බව ප්‍රකාශ කරමින් දුරකථනය හරහා ඒ සිනහා හඬ ඉතිරිණ. අතර මඟක සිට ජංගම දුරකථනයෙන් අප හා එක් වීම වෙනුවෙන් බණ්ඩාර ඇහැළියගොඩ නිබන්ධකයාණන්ට ස්තූතිවන්ත වුයෙමු, අපි. ගීය අප වෙත එවු කලිඳු සොයුරාට ද ස්තුතියි.

මේ කඳුල කඳුලක් ය
නෙතින් ගිලිහී නොයන
මේ සුසුම සුසුමක් ය
ළය මඬල කකියවන
මේ තැවුල තැවුලක් ය
මතු මතු ද අප දවන
මේ හිදැස හිදැසක්ය
කිසි කලෙක නොපිරවෙන

මහරු සමනොළ සිරස
වන්දනා කළ ගමක ජනිත වී
ජීවිතේ සොයාගෙන අයාලේ ආ ගමන
නැවතුනේ උතුම් ලක් පුතෙකු වී
රැඟුම් ලොව සසළ කළ
රංගධරයා ඔබ ය
අපේ කම හැර නොගිය
සොඳුරු ගැමියා ඔබ ය

අපෙන් ලෝකෙට පිදුන
රංගනෙන් සිංහලේ ළකුණ වී
දෙස් විදෙස් වලින් ලද
මහරු මිණි කිරුළ ගෙන
උතුම් ලක් මව් සිරස පැළැඳ වී
දැයේ නව පරපුරට
මඟ කිවුයේ ඔබය
අපේ සිත් හඬවමින්
නිහඬ වුයේ ඔබය

ගායනය : අමරසිරි පීරිස්
සංගීතය : රෝහණ වීරසිංහ
රචනය : බණ්ඩාර ඇහැළියගොඩ

Dhammika Kulatunga
Ph : 03 9308 1647
Mob : 0411 272 162
DD REFRIGERATION
☆ Installation, repairs & maintenance of Split type air conditioning
☆ Repairs of domestic & commercial refrigerators freezers and cool rooms
☆ Repairs of Electrical Appliences
Fully licensed for air conditioning plumbing

GATEWAY
LAWYERS
▶ Advice on Legal Matters
▶ Business & Commercial Law
▶ Sale of Business
▶ Conveyancing
▶ Powers of Attorney
▶ Wills & Estate Planning
▶ Migration Law
Senanie Kurukularatne LL.B
Barrister & Solicitor
Attorney-at-Law Sri Lanka
Registered Migration Agent
MARN 0854193
T 03 8786 9682
F 03 8786 9681
M 0414 660 513
gateway5@bigpond.net.au
DX 30463 Berwick VIC 3806
PO Box 730 Berwick VIC 3806
17 Glenview Rise Berwick VIC 3806 Australia